**විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල - 2020**
---------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2001 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ වටිනාකම රු.48,891,896 ක් වූ නිකුත් කළ නමුත් හිමිකම් නොපෑම හේතුවෙන් අවලංගු වූ චෙක්පත් 473 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ දක්වා තිබුණ ද, එම අරමුදල් ගෙවා නිදහස් කිරීමට කළමනාකරණය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. | විගණන විමසුමේ සඳහන් පරිදි හිමිකම් නොපෑ අවලංගු චෙක්පත් සඳහා හේතු වී ඇත්තේ නිසි පරිදි සාමාජිකයා විසින් බැංකු ගිණුම් විස්තර සපයා නොතිබීම වේ. මේ පිළිබඳව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් සුපරීක්ෂණ කමිටුවේ නිර්දේශ වලට අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ආදාල නම් ලැයිස්තුව ප්‍රසිද්ධ කර ඇත. | හිමිකම් නොපාන ලද ශේෂයන් පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුවත් කර නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 93(2) වගන්තිය | මොරටුව විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතුව සිටි කථිකාචාර්යවරියකගේ සේවය 2000 සැප්තැම්බර් 10 දින නතර කර තිබුණ ද අරමුදලේ ශේෂය නිදහස් | 1982.02.05 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 155 අනුව, සේවයෙන් ඉවත්වී මාස 02 ඇතුලත | විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව විශ්‍රාම ගැනීමට පෙර යම් හේතුවක් මත සේවය නතර කළ විට අරමුදලේ සේවකයා |

| | | | | |
|---|---|---|---|---|
| | | කිරීම 2020 මැයි 29 දින දක්වා මාස 227 ක කාලයක් ප්‍රමාද කර තිබුණි. සේවය අවසන් කරන ලද දිනට ගිණුමේ පැවති රු.227,072 ක් වූ ශේෂයට රු.1,228,899 ක පොලිය ද සමග රු.1,455,971 ක් නිදහස් කර තිබුණි. | අර්ථසාධක අරමුදලේ නිදහස් කිරීමේ පත්‍රිකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත එවිය යුතු අතර කථිකාචාර්යතුමියකගේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ පත්‍රිකා සේවය අත්හිටුවා මාස 227 කට පසුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත එවා ඇත. එම දින සිට අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ ඉදිරි පියවර ගෙන ඇති අතර අදාළ සාමාජිකයාට ඔහුගේ ගිණුමේ බැර ශේෂය මත පදනම්ව පොලී ගණනය කර ඇත. ඒ අනුව අරමුදලට අලාභයක් සිදුවී නොමැති අතර සේවකයාගේ බැර ශේෂය මත ගලපන ලද පොලිය නිවැරදිව ගෙවා ඇත. | නමින් පවතින ශේෂය සහ පොලිය ප්‍රමාදයකින් තොරව සේවකයාට ගෙවීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 95 වගන්තිය | (i) දායකයාගේ ගිණුම අවසන් කර මාස 03 ක කාලයක් ඇතුළත දායකයාගේ ගිණුමේ ඇති ශේෂය ගෙවා අවසන් කළ යුතුව ඇත. එසේ වුවද සේවය කරන ලද දායකයන් 108 දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් අදාළ උසස් අධ්‍යාපන ආයතනය වෙත යොමු කර ගෙවීම් කිරීම සඳහා මාස 01 සිට මාස 317 ක් දක්වා වූ පරාසයක ප්‍රමාදයන් සිදුවී තිබූ අතර එම ප්‍රමාද කාලය වෙනුවෙන් රු.9,241,071 ක පොලී මුදලක් ගෙවා තිබුණි. | සෑම වසරකම අවසන් ගිණුම් පිලියෙල කර ඉදිරි වසර සඳහා පොලී අනුපාතය තීරණය කරන තුරු දෙසැම්බර් සිට පෙබරවාරි මාසය දක්වා ගෙවීම් නතර කරන බැවින් මාස 2 - 3 ත් අතර කාලයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ පත්‍රිකා රදවා ගැනීමට සිදු වී ඇතඒ අනුව . තිපාදන ල ප්‍රවිශ්වවිද්‍යා කොමිෂන් සභාවේ කිසිදු මාදයක් සිදු වී ප්‍ර ලි නොමැති බව පැහැදි එමෙන්ම පොලී .වේ ගෙවීම සමාජිකයන්ගේ | පනතේ 95 වගන්තිය ප්‍රකාරව දායකයා සේවය අවසන් කර මාස 03 ක කාලයක් ඇතුළත ශේෂය නිදහස් කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | බැරට ඇති මුදල මත පදනම්ව සිදුකර ඇති බැවින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සාමාජිකයාට හිමි නොවන කිසිදු ප්‍රමාද පොලියක් ගෙවා නොමැත. මෙම ගෙවීම දරන 16 අංක 1978 ලවිශ්වවිද්‍යාපනතේ 95 වන වගන්තියට අනුකූල .වේ | |
| | | (ii)සේවය අවසන් කරන ලද සේවා දායකයා සිතාමතාම හෝ නොසැලකිලිමත්භාවය මත අරමුදල නිදහස් කර ගැනීම සඳහා අයදුම්කිරීම මාස 01 ක සිට මාස 312 ක් දක්වා වූ කාලපරාසයක ප්‍රමාදයන් තිබූ අතර ප්‍රමාදවී අයදුම්කිරීමේ තත්ත්වය මගහැරවීම සඳහා කොමිෂන් සභාව විසින් ප්‍රමාණවත් විධිවිධාන සැලසීමට කටයුතු කර නොතිබුණි. | 1982 පෙබරවාරි 02 දිනැති අංක 155 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ මගින් මේ සඳහා ප්‍රතිපාදන සලසා ඇති අතර මේ වනවිට අර්ථසාධක අරමුදල් අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කටයුතු තවදුරටත් විධිමත් කර නව චක්‍රලේඛන කෙටුම්පතක් සකස් කර ඇති අතර එය ඉදිරියේදී නිකුත් කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ. | සේවය අවසන් කරන ලද සේවා දායකයන් සිතාමතාම හෝ නොසැලකිලිමත්භාවය මත අරමුදල් නිදහස් කිරීමට ඉල්ලුම් කිරීම ප්‍රමාද කිරීම අවම කිරීම වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 1982 පෙබරවාරි 02 දිනැති අංක 155 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | (i)උසස් අධ්‍යාපන ආයතනය වෙත යොමු කරන ලද අයදුම්පත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත මාස 02 ක් ඇතුළත යොමු කිරීම අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ යම් වරදක් හෝ ප්‍රමාදයක් මත සිදුවුවහොත් එම ප්‍රමාදය මත ගෙවන ලද පොලිය අදාළ වගකිය යුතු නිලධාරියාට අධිභාර කළ යුතුය. එසේ වුවද කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත යොමු කිරීමේදී මාස 01 සිට මාස 34 ක කාලපරාසයක ප්‍රමාදවීම මත පොලිය ගණනය කර ගෙවීම් කිරීමේදී චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් සුපරීක්ෂණ කමිටුවේදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කල අතර විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්ගේ මතය වනුයේ ප්‍රමාදයට හේතුව නිළධාරීන්ගේ වරද මතම නොව තොරතුරු සැපයීම හා එක්රැස්කිරීම සඳහා ගතවන කාලය බවයි.ඒ අනුව මේ වන විට මේ සම්බන්ධයෙන් නව මාර්ගෝපදේශ ඇතුලත් චක්‍ර ලේඛ කෙටුම්පතක් සකස් කොට ඇත.එය ඉදිරියේදි නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අරමුදල නිදහස් කිරීමේදී යම් ප්‍රමාදයක් සිදු වී ඇත්නම් එම ප්‍රමාදයට හේතුව නිවැරදිව හඳුනාගෙන ඊට වගකිව යුතු නිලධාරීන් වෙත අධිභාර කිරීමේ කටයුතු විධිමත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (ii)දායක මුදල් නිදහස් කර ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත උසස් අධ්‍යාපන ආයතනය වෙතින් යොමු කරන ලද අයදුම්පත් සලකා බලා මාසයක් ඇතුළත දායකයා වෙත අරමුදල නිදහස් කිරීමට කටයුතු කළ යුතු වුවද ඒ සඳහා මාස 01සිට මාස 53 ක් දක්වා කාල ප්‍රමාදයක් සිදුව ඇති බව නිරීක්ෂණය විය. | එම අයදුම්පත් නිසිලෙස පුරවා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට සත්‍ය වශයෙන්ම ලැබුණු දිනයන් මෙහිදී සැලකිල්ලට ගත යුතුය. මීට අමතරව සෑම වර්ෂයකම දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා කාලයේදී ලැබෙන අර්ථසාධක අරමුදල් අයදුම්පත් අවසාන ගිණුම් සකසා වාර්ෂික පොළිය ගණනය කරන තුරු දෙසැම්බර්, ජනවාරි හා පෙබරවාරි මාස වලදී අර්ථසාධක අරමුදල් නිකුත් නොකෙරේ. එසේම 2020 වසරේදී කොවිඩ් 19 ව්‍යාප්තිය හේතු කොට ගෙන 2020.03.13 සිට 2020.05.13 දක්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා කටයුතු නවතා තිබීම මීට හේතුවේ. | උසස් අධ්‍යාපන ආයතන වෙතින් ලේකම්වරයා වෙත යොමු කරන අයදුම්පත් සලකා බලා දායක මුදල් නිදහස් කිරීමේදී සිදුවන ප්‍රමාදය අවම කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය
------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,063,226,896 අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,770,201,568 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.293,025,328 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආයෝජන ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.